# විවිධ අමරණීය දෙවිවරු

අපට සමීප සංස්කෘති, අප දන්නා සංස්කෘති ගත්කළ දෙවියන් වර්ග දෙකක් හෝ තුනක් ඇතැයි අපි කීවෙමු. ඉන් එක් වර්ගයක් වනුයේ සංසාරයේ සැරිසරන සත්වයන් දේව භවයක උපත ලැබීම හේතුවෙන් ඇතිවන දෙවියන් ය. මේ දෙවියෝ තාවකාලික වෙති. ඔවුහු කාලයාගෙ ඇවෑමෙන් දෙව්ලොවින් චුත වී මනුෂ්‍ය තිරිසන් වැනි වෙනත් ලෝකවල උපදිති. එසේ ම ඉන්පසුව නැවතත් ඔවුන්ට දිව්‍ය ලෝකවල ඉපදීමේ අවස්ථාව ලැබෙයි. මෙවැනි දෙවියන් බෞද්ධයනට හුරු පුරුදු ය.

අනෙක් දේව කොටස් දෙක සත්වයන්, වස්තු හෝ ගුණ හෝ මත දේවත්ව ආරෝපණයෙන් ලැබෙයි. අවශ්‍ය නම් මේ දෙවර්ගය ම එක් වර්ගයක් ලෙස ගත හැකි ය. මේ දෙවියෝ අමරණීය වෙති. ඔවුහු සදාකාලික වෙති. අග්නි, වරුණ ආදී දෙවිවරු මෙන් ම ගණ, සරස්වතී ආදී දේව  දේවියෝ අමරණීය වෙති. වෛදික දෙවිවරුන් සුරයන් අමරණීය වුයේ අමෘතය බිහිවීමෙන් බවට වෛදිකයන් නිර්මාණය කළ ප්‍රවාදයක් වෙයි. එහෙත් මොවුන් බෞද්ධ සංස්කෘතියට අවශෝෂණය වන්නේ බොහෝ ආයුෂ ඇති නමුත් මරණයට පත්වන දෙවියන් ලෙස ය. එසේත් නැත්නම් බුද්ධත්වය පතන බෝසතුන් වහන්සේලා ලෙස ය.

මෙයට අමතර ව තවත් වර්ගවල දෙවියන් වෙනත් සංස්කෘතිවල පැවතීමට හැකි ය. අප බොහෝ විට හදාරන්නේ ඉන්දු යුරෝපීය සංස්කෘතීන් බැවින් වෙනත් සංස්කෘතීන්හි තිබිය හැකි දේව සංකල්ප පිළිබඳ අපට එතරම් දැනුමක් නැත. සමහරවිට වෙනත් සංස්කෘතීන්හි එවැනි දේව සංකල්ප නැතිවීමට ද හැකි ය. භාරතීය සංස්කෘතිය නැගෙනහිර ආසියාවට ගලායෑමට පෙර ඒ රටවල සංස්කෘතින්හි දේව සංකල්පය තිබිණි ද යන්න හැදෑරීම වැදගත් ය.

පැරණි මිසරයේ දේව සංකල්පයක් තිබී ඇති බව පැහැදිලි ය. හිරු දෙවියන් පිළිබඳ සංකල්පය පැරණි මිසරයන්ට විය. රා නමින් හැඳින්වුණු දේව සංකල්පයක් ද මිසරයේ විය. මිසර සංස්කෘතිය පසුව විනාශ වී අද ඊජිප්තුව නමින් හැඳින්වෙන රට බිහිවිණි. ඊජිප්තුවේ අද ඇත්තේ මුස්ලිම් සංස්කෘතියකි. ඇතැම් උගතුනට අනුව ක්‍රිස්තුස් වහන්සේ යන සංකල්පය බිහි වී ඇත්තේ මිත්‍ර දෙවියන් ආශ්‍රයෙනි. ක්‍රිස්තුස් වහන්සේගෙ උපත සමග බැඳී ඇති නත්තල් උත්සවය මිත්‍ර දෙවි සමග බැඳී ඇතැයි කියැවෙයි. අපි ඒ පිළිබඳ පසුව සාකච්ඡා කරමු.

පැරණි පර්සියාවේ දේව සංකල්පය බෙහෙවින් පැතිරී තිබිණි. ඇතැමුනට අනුව ලෝකයේ පැරණිම ආගම ලෙස සැලකෙන්නේ ශරතුස්ත්‍ර දහම ය. එහි පැරණි ම ලියවිලි අවෙස්තා ග්‍රන්ථ නමින් හැඳින්වෙයි. යස්න නම් ග්‍රන්ථවල සඳහන් ශරතුස්ත්‍ර දහමෙහි භක්ති ගී හැඳින්වෙන්නේ අපට හුරු පුරුදු වචනයක් වන ගාථා නමිනි. පැහැදිලිව ම ශරතුස්ත්‍ර දහම යුදෙව් ආගමට මෙන් ම ක්‍රිස්තියානි, ඉස්ලාම් ආගම්වලට ද, වෛදික ආගම්වලට ද බුදුදගමට ද බලපෑම් කර ඇත. එහෙත් මිසරය පසුව ඊජිප්තුව වුවාසේ ම පර්සියාව ද අද ඉරානය බවට පත්වී ඇත්තේ සංස්කෘතිය ද වෙනස් කරගනිමිනි. අද ඉරානයේ ද ඇත්තේ මුස්ලිම් සංස්කෘතියකි.

ඒ කෙසේ වෙතත් දේව සංකල්පය මුලින් ම ඇතිවුයේ කිනම් සංස්කෘතියක ද යන්න ද අධ්‍යයනය සඳහා සුදුසු මාතෘකාවකි. එය දඹදිව ඇතිවූවක් ද? ඇතැම් උගතුන්ට අනුව දැනට අවුරුදු භාරදහසකට පමණ පෙර උච්චස්ථානයකට පත් වූ මොහෙන්ජදාරෝ හරප්පා සංස්කෘතීන්හි ශිව දෙවියන් පුදා ඇති බවට සාක්ෂි වෙයි. මේ ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර ය. එකල දඹදිව වාසය කළෝ කිනම් ගෝත්‍රයකට අයත් වූවෝ ද? ඔවුන් කවුරුන් වුවත් ද්‍රවිඩයන් විය නොහැක්කේ ද්‍රවිඩ ගෝත්‍රිකයන් දඹදිවට පැමින ඇත්තේ ආර්යයන් පැමිණීමෙන් පසුව බැවිනි.

ඇතැම් විට දේව සංකල්පය සංස්කෘතීන් ගණනාවක් විසින් එකිනෙකින් ස්වායත්ත ව නිර්මාණය කෙරෙන්නට ඇත. අප අසා ඇති ප්‍රශ්නය, එනම් දේව සංකල්පය මුලින් ම බිහිවූයේ කිනම් සංස්කෘතියක ද යන්න ම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියක ඇසෙන ප්‍රශ්නයකි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ඒකදේවවාදය හේතුකොටගෙන මුලින් ම ඇතිවූයේ කවුද කොහේද ආදී ප්‍රශ්න පැන නැගෙයි. මිනිසා මුලින් ම ඇතිවූයේ අප්‍රිකාවේ බවට අද බටහිර විද්‍යාවේ දක්නට ලැබෙන මතයේ පසුබිම ද ඒ එක් මුලක් පමණක් සෙවීම මත පදනම් වෙයි. ඩාවින්ගේ පරිණාමවාදය ද බිහි වී ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බව අමතක නොකළ යුතු ය. කෙසේ වෙතත් දේව සංකල්පය නිර්මාණය වී ඇති සංස්කෘතීන් කවරේදැයි සොයා බැලීම වැදගත් ය.

© Prof. Nalin De Silva

ලතින් භාෂාවෙන් ව්‍යුත්පන්න වූ භාෂාවල දෙවියන් යන්න හැඳින්වෙන්නේ ඩේයුස් (deus) හා ඩිවුස් (divus) යන්නෙන් බිඳුණු වචනවලිනි. පැහැදිලිව ම ඒ වචන හා දේව යන්න අතර සමාන කමක් වෙයි. ඒ සියල්ල ඉන්දු යුරෝපීය ප්‍රාකෘතයක ඩෙයිවොස් (deiwos) යන්නෙන් බිඳී ඇතැයි ඇතැම් උගත්තු පවසති. ඩෙයිවොස් යන්න ඩිවයින් (divine - දිව්‍යමය) යන්න සමග බැඳෙයි. ග්‍රීක සංස්කෘතියේ මහා දෙවියා හඳුන්වන සියුස් (Zeus) යන ග්‍රීක වචනය ද ඩේයුස් සමග බැඳී ඇත.

එසේම දෙවියන් හා බැඳුණු දෙමළ බසින් ගත් තේවාව ඉංගිරිසි බසෙහි තීසීස්, තියෝ, තියරම්, තියොලොජි (theology -දේවධර්මවාදය) ආදිය ද එකම මූලයකින් ලැබෙන බව පැහැදිලි ය. තීසීස් යන්න දේව දැනුමක් යන අර්ථය දනවයි. ප්‍රමේයය සඳහා ඉංගිරිසි වචනය වූ තියරම් යන්නෙන් ද යම් ආකාරයක දේව දැනුමක් ගැන කියැවෙයි. එකදේවවාදය ඉංගිරිසියෙන් මොනොතීසම් (monotheism) ලෙස ද බහුදේවවාදය පොලිතීසම් (polytheism) ලෙස ද හඳුන්වනු ලැබෙයි. එහි දී ද තීසම් යන වචනය දෙවියන් සමග සම්බන්ධ වන බව පැහැදිලි විය යුතු ය. .

එහෙත් ඉංගිරිසි බසෙහි දෙවියන් හැඳින්වීමට ගෝඩ් (God) යන පදය යෙදෙන්නේ ඇයි දැයි කිසිවකුට ඇසිය හැකි ය. ඉංගිරිසියෙහි ග්‍රීක හා ලතින් භාෂාවලින් ලබාගත් වචන තිබිණි ද එය ජර්මානු මූල සහිත භාෂාවකි. එබැවින් එහි ගෝඩ් යන්න ග්‍රීක හෝ ලතින් හෝ මූලයකින් ලැබෙන්නක් නො වෙයි.

ඉන්දු යුරෝපීය භාෂාවල දෙවියන් සඳහා එකම මූලයකින් බිඳුණු වචන යොදා ගැනීමෙන් පැහැදිලි වන්නේ දේව සංකල්පය ඒ භාෂාවල් සමග බැඳුණු පොදු සංස්කෘතියක නිර්මාණය වී ඇති බව ය. එහෙත් මෙහි දී ඒ මූලය බහුදේවවාදී සංස්කෘතියක නිර්මාණය වූයේ ද එසේත් නැත්නම් එකදේවවාදී සංස්කෘතියක නිර්මාණය වී ද යන්න නිශ්චිතව දැනගැනීම අසීරු ය. එසේ වුවත් පැරණි ග්‍රීක හා රෝම සංස්කෘතීන් බහුදේවවාදී සංස්කෘතීන් විය. ග්‍රීකයන්ගේ සියුස් මහා දෙවියා සමග ඇපලෝ ආදී දෙවිවරු ද ඇතීනා ආදී දෙවඟනෝ ද සිටියහ. සියුස් දෙවියන් ලෝකය මැවීමේ කාර්යයෙහි යෙදුණේ ද නො වේ.

බොහෝ විට සිදුවන්නට ඇත්තේ පළමුව බහුදේවවාදී සංස්කෘතීන් බිහි වී පසුව එකදේවවාද සංස්කෘතීන් බිහිවීම ය. එහෙත් ඒ එසේ නොවන්නට ද හැකි බව සිහි තබා ගත යුතු ය. කෙසේ වෙතත් දැනට අපට මේ කරුණුවලින් අනුමාන කළ හැක්කේ පැරණි දේව සංකල්පය බහුදේවවාදී සංස්කෘතීන්හි පැන නැගුණු එකක් බව ය.

දේව යන්න එක් දෙවියකුට පමණක් යෙදෙන රෝමානු - ලතින් මූල සහිත භාෂාවක් නම් පෘතුගීසි භාෂාව ය. සමහර විට එයට හේතුව වන්නට ඇත්තේ පෘතුගීසි සංස්කෘතියට දේව යන සංකල්පය එකතු වී ඇත්තේ ම එකදේවවාදී සංස්කෘතියකින් වීම නිසා විය හැකි ය. වෙනත් වචනවලින් කියන්නේ නම් දේව යන සංකල්පය පෘතුගීසි සංස්කෘතියට එකතු වූයේ රෝම අධිරාජ්‍යයෙන් නම් ඒ අධිරාජ්‍යය ඒ වන විටත් එකදේවවාදය වැළඳ ගෙන තිබෙන්නට ඇත.

ග්‍රීසියේ රෝමයේ මෙන් ම වෛදිකයන්ගේ ද දෙවිවරු මිනිසුන්ගෙන් වෙනස් නො වූහ. අප කලින් ද කියා ඇති පරිදි මේ දෙවිවරු මිනිස් ලොව ගැහැණුන්ට පෙම් කළහ. දිව්‍යාංගනාවෝ මිනිස් ලොව පිරිමින් සමඟ සම්බන්ධකම් ඇතිකර ගත්හ. ග්‍රීකයන්ගේ ඉලියඩ් හා ඔඩිසි කාව්‍යවල මෙන් ම භාරතයේ රාමායණයේ හා මහාභාරතයේ දෙවිවරු මිනිසුන් සමග එක්වී යුද්ධ කළහ. මේ සියල්ලෙන් පැහැදිලිවන කරුණ නම් මේ පැරණි සංස්කෘතීන්හි දෙවිවරුන් මිනිසුන් විසින් තම හැඩරුව හා ගුණ අනුව මවනු ලැබූ බව ය. මිනිසුන් සත්වයනට වස්තුවලට හා ගුණවලට දේවත්ව ආරෝපණය කරන්නට ඇත්තේ ම තමන් මුල්කරගෙන බව පැහැදිලි ය. එක් වර්ගයක (අවශ්‍ය නම් වර්ග දෙකක) දෙවියන් මවනු ලැබ ඇත්තේ මිනිසුන් විසින් බව පැහැදිලි ය.

එහෙත් අපි තවත් වර්ගයක දෙවියන් ගැන සඳහන් කෙළෙමු. ඒ සසර සැරිසරන සත්වයන් තාවකාලික ව දෙවියන් ලෙස උපත ලැබීම හේතුවෙන් අපට හමුවන දෙවිවරුන් ය. මේ දෙවිවරුන් ද අවසාන වශයෙන් ගත්කල අපේ නිර්මාණ (සියලු සංකල්ප නිර්මාණ ලෙස සැළකීමෙන්) ලෙස සැළකෙන නමුත් ඔවුන්ට මිනිසුන්ට හා අනෙක් සතුන්ට මෙන් ම භවයක් ඇත. මේ දෙවිවරුන් ඇතැමුනට (මිනිසුන්ට) දක්නට ලැබෙන බව ද අමතක නොකළ යුතු ය. මේ දේව ගණයා බ්‍රහ්ම, ප්‍රේත ආදීන් මෙන් ම සත්වයෝ වෙති.

© Prof. Nalin De Silva

ඇතැමුනට දක්නට ලැබෙන බැවින් මිනිසුන් මේ දේව ගණයා පිළිබඳ ව ඈත අතීතයේ සිට ම දැන සිටියා විය යුතු ය. එහෙත් එවැනි දේව ගණයක පැවැත්ම නිගමනය කිරීමට ඒ ඒ සංස්කෘතීන්ට හැකිවිණි යැයි මෙයින් නො කියැවෙයි. විවිධ භූතාත්ම ගැන විවිධ සංස්කෘතීන්හි සඳහන් වෙතත් ඒ නිරීක්ෂණ එකට ගෙන ගලපා සංගත කතාවක් නිර්මාණය කරගැනීමට හැකි වී ඇත්තේ සංස්කෘතීන් කිහිපයකට පමණක් බව පැහැදිලි ය.

ඇතැමුනට පමණක් නිරීක්ෂණය වන සත්ව ගණයා පිළිබඳ අපට බොහෝ විට ඇත්තේ බියකි. මේ බොහෝ සත්වයන් අපට වින කරන පිරිසක් ය යන්න බොහෝ සංස්කෘතීන්හි පිළිගත් මතය බවට පත් වී ඇත. ඒ සත්වයන් සදාකාලික ද නැද්ද යන්න එතරම් සාකච්ඡා වී ඇති ප්‍රශ්නයක් යැයි කිව නො හැකි ය. මේ සත්වයන් මරණයට පත්වන මිනිසුන් සමග සම්බන්ධ යැයි යක්ෂ හා වෙනත් සංස්කෘතීන්හි තේරුම් ගෙන ඇති බව පැහැදිලි ය.

නෑ යකුන් මළ යකුන් පිළිබඳ සංකල්පවලින් පැහැදිලි වන කරුණ නම් සංසාරය යන සංකල්පය ඇතිව හෝ නැතිව හෝ මිනිසුන් මිය යෑමෙන් පසුව වෙනත් ආකාරයක ශරීර සහිතව ඉපදෙන බවට දැනුමක් ඇතැම් සංස්කෘතීන් විසින් නිර්මාණය කෙරී ඇති බව ය. මේ මළ යකුන් සතුටු කිරීමට ඇතැම් වත් පිළිවෙත්වල නිරතවීමට මේ සංස්කෘතීන්වල ජීවත්වූවෝ පුරුදු වී සිටියහ. මියගිය යකුන්ගෙන් ඇතැමුන් අපට වින කරන සත්වයන් ලෙස උපදින අතර තවත් අය අපට උපකාර කරන සත්වයන් ලෙස ද උපත ලබන බව යක්ෂ ගෝත්‍රිකයන්ට වැටහීමක් තිබී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva